දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය ) NA/14/01/2020 - T
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2025.11. 26
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
## Ministry of Health & Mass Media

පොදු චක්‍රලේඛ අංක - 01-46/2025

කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂ,

<u>I ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සිට විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) තනතුරට උසස් කිරීම මත පත් කිරීම.</u>

හෙද සේවාවේ අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) හා I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සිට විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) තනතුරට උසස් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති කළුතර, ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ සේවයේ යෙදී සිටින පහත සුදුසුකම් සපුරාලන හෙද සේවාවේ අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) හා I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සිටින නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අධි සේවක පදනම මත I වන ශ්‍රේණියට උසස් වී ඇති හෙද නිලධාරීන්ට මේ සඳහා අයදුම් කළ නොහැක.

02. අයදුම්කරුවන් විසින් පහත සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

I. අංක 02/115/2021 හා 2021.12.20 දිනැති පොදු චක්‍රලේඛය මගින් අයදුම් කර, 2022.05.27 දින පැවති සම්මුඛ පරීක්ෂණය මගින් තෝරාගෙන, 2023.05.10 දිනැති අනුමැතිය ලත් නිලධාරීන් හැර එයට අතිරේකව හෙද ආචාරිණී පුහුණුව ලබාදුන් නිලධාරීන් හට පමණක් අයදුම් කළහැකි වේ.

II. ජාතික හෙද අධ්‍යාපන ආයතනය / පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය අඩංගු අවුරුදු 1½ ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා, අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ නිලධාරියෙකු වීම හෝ 1 වන ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරක වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01-2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

IV. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම සහ සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

VI. හෙද ආචාරිණියක ලෙස ජාතික සෞඛ්‍ය විද්‍යායතනය මගින් ලබාදෙන මාස 06 ක පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

03. අයදුම් පත් එවීමේ ක්‍රමය

ඇමුණුම 01 මගින් දැක්වෙන ආකෘතිය අනුසාරයෙන් අයදුම්කරුවන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත් 2025.12.08 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙනසේ ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානින් විසින් ලැබෙන අයදුම්පත්වල තිබෙන කරුණු අයදුම්කරුවන්ගේ පෞද්ගලික ලිපි ගොනුවල අදාළ වාර්තා සමඟ සසඳා බලා එහි සඳහන් විස්තරවල නිරවද්‍යතාව පිළිබඳව සහතික කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.12.16 දිනට හෝ ඊට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙනසේ, අධ්‍යක්ෂ (පාලන) I, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ වගකිව යුතු අයෙක් මගින් අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කළ යුතුය. කිසිදු හේතුවක් නිසාවත් නිලධරයෙකු විසින් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ රහිතව හෝ ආවරණ ලිපියක් රහිතව ඉදිරිපත් කරන අයදුම්පත් භාරගනු නොලැබේ. මෙම නිවේදනයට පරිබාහිරව ඉදිරිපත් කර සෑම අයදුම්පතක්ම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. උසස් කිරීමේ ක්‍රමය

4.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව, හෙද සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්කර විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) තනතුරට පත් කිරීම, පත් කිරීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

4.2. විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) තනතුරට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 02 හි සුදුසුකම් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය වන 2025.12.08 දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

4.3. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි I වන ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරි (මහජන සෞඛ්‍ය) තනතුරට පත් වූ දිනය අනුව සකස් කරන ලද ජ්‍යෙෂ්ඨතා ලේඛනය ද, විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාව ද අනුව අදාළ පත් කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. එකම දින හෙද සේවයේ I වන ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරි (මහජන සෞඛ්‍ය) තනතුරට උසස් වූ නිලධාරීන් සිටි නම් ඔවුන් I වන ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරි (මහජන සෞඛ්‍ය) තනතුරට උසස්වීමට අදාළව පශ්චාත් ප්‍රාථමික හෙද විදුහලේ / ජාතික හෙද අධ්‍යාපන ආයතනයේ පුහුණුවේ අවසන් පරීක්ෂණයේදී ඔවුන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ තැන තීරණය කරනු ලැබේ.

05. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව MT 8-2025 වැටුප් ඛණ්ඩය මෙම තනතුරට අදාළවන අතර එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

06. මෙසේ උසස් වීමට නියමිත නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) තනතුරට පත් කරනු ලැබේ. පුරප්පාඩු පවතින ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට අනිවාර්යයෙන්ම පත්වීම් ලබා දෙනු ඇත.

07. විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) තනතුරට උසස් කළ නිලධාරියෙකු රජයට අතිරේක වියදමක් නොවන අයුරින් කෙටි දැන්වීමකින් පත් වීම භාර ගත යුතු අතර, එසේ තනතුරට පත් කිරීමෙන් පසු සති දෙකක් තුළ අදාළ තනතුරේ සේවය සඳහා වාර්තා නොකළ හොත් අදාළ නිලධරයාගේ උසස්වීම අවලංගු වේ.

08. ඉහත කොන්දේසි යටතේ උසස් වීම ලබාගැනීමට එකඟවන නිලධාරීන් පමණක් අදාළ ආයතන ප්‍රධානියා මගින් අයදුම් කළ යුතු ය.

09. තවද මෙම නිවේදනය මගින් ආවරණය නොවන යම් කරුණක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත.

10. තවද, මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ඇමුණුම - 01

<u>I ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සිට විශේෂ ශ්‍රේණියේ හෙද ආචාරිණී (මහජන සෞඛ්‍ය) තනතුරට උසස් කිරීම මත පත් කිරීම</u>

01. නිලධාරිනියගේ සම්පූර්ණ නම - ........................................................................................
..........................................................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය - ........................................................................................

03. i. I වෙනි ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) ලෙස උසස්වූ දිනය - ..................
ii. I වෙනි ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) ලෙස වැඩ භාරගත් දිනය - ..................

04. විනය පරීක්ෂණ හා විනය දඬුවම් ලබා තිබේද හා විනයානුකූලව කටයුතු කෙරෙමින් පවතිද?
.........................................................................................................................
(එසේ නම් කාල සීමාවට අදාළ නියෝගයේ පිටපතක් අමුණන්න)

05. සේවා කඩවීම්, I වෙනි ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරට පත්වීමෙන් පසු ලබා ගත් වැටුප් රහිත නිවාඩු තිබේ නම් අදාළ කාලසීමාව සඳහන් කරන්න.
.........................................................................................................................

06. i. ප්‍රසූත නිවාඩුවලට අදාළ වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් කාල සීමාව - ...................................
ii. ප්‍රසූත නිවාඩුවලට අදාළ නොවන වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් කාල සීමාව - ..............................

07. 2020.12.08 – 2025.12.08 කාලසීමාව තුළ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද?
.........................................................................................................................
(ලබා තිබේ නම් කාලසීමාව සඳහන් කරන්න)

08. වැටුප් වර්ධක දිනය - ........................................................................................
(පෞද්ගලික ලිපිගොනුව අනුව පහත සඳහන් වර්ෂවල වැටුප් වර්ධක උපයාගෙන තිබේද / නැද්ද සහ කාර්ය සාධනය සඳහන් කරන්න)

| වර්ෂය | වැටුප් වර්ධක උපයාගෙන තිබේද | කාර්ය සාධනය |
|---|---|---|
| 2020 - | | |
| 2021 - | | |
| 2022 - | | |
| 2023 - | | |
| 2024 - | | |
| 2025 - | | |

ඉහත නම සඳහන් විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරියා / නිලධාරිනිය ගේ පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය ................................

..............................................
විෂයභාර නිලධාරීගේ අත්සන

09. <u>පරිපාලන නිලධාරි / රෝහල් ලේකම්ගේ නිර්දේශය -</u>

.............................................................................. විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරියා / නිලධාරිනිය ගේ පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත තොරතුරු නිවැරදි බවට නිර්දේශ කරමි.

දිනය ....................................                                        ..................................................

පරිපාලන නිලධාරි / රෝහල් ලේකම් ගේ අත්සන

10. <u>ආයතන ප්‍රධානියාගේ නිර්දේශය -</u>

ඉහත නම සඳහන් නිලධාරියා ................... දින සිට විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සේවය කරන බවටත්........................................................... මයා / මියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත තොරතුරු සත්‍ය බවට නිර්දේශ කරමි.

දිනය ................................                                        .....................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව